# කොළඹ විශ්වවිද්‍යාලය

## ශාස්ත්‍ර පීඨය

## ශාස්ත්‍රවේදී උපාධි පළමු වසර පරීක්ෂණය

## දෙවන සෙමෙස්තරය- 2016/2017

# SLG 1202 – සාහිත්‍ය ප්‍රවේශය

(පැ දෙකයි)

ප්‍රශ්න <u>හතරකට</u> (04) <u>පමණක්</u> පිළිතුරු සපයන්න.

---

1. වින්දනාත්මකව විමසන්න.

ඇලපාතගේ විරෝධය

නිමිත්ත : - ගජමන් නෝනාගේ මිදුලේ රජයේ නිළ නිවාසයක් තනයි - පුවතක්

වතාවත් සදෙව් නෙත් දෙක නිලු පුල්ලා
කතා කළේ මිදුලේ පිල පිට ඉඳලා
ඇතා යුර ගමන් ගියෙ මට දුක කියලා
හිතේ දුකට කියනෙමි මේ කවි ගොතාලා

සිසි උවනතින් සුපසන් මා නෝන සඳ
ඇසි දිසි ලෙසින් නුඹ දිවමන් වෙය හඳ
රට තුළ යෙහෙන් වැජඹෙන පුහුදනන් මැද
මටතුළ සතොස් නැත දුටු කාරණෙන් අද

රන් කඳ දෝ මිහි සයනේ නිදන්නේ
නුග රුකදෝ දෙණිපිටියේ දිරන්නේ
පින් මදි දෝ ඉඩමට විත කටින්නේ
ගොන් කම දෝ අණ කරවන එවුන්නේ

දුකක් නො දී ඇති කළ ළම පැටවුන්ට
ටිකක් විතර ඉඩ තිබුණයි දඟලන්ට
එහෙව් මිදුල පස පෙරළා හාරන්ට
බොලව් මොලේ උණ හැදිල ද ඌරන්ට

2. "ශ්‍රේෂ්ඨ යැයි ගැනෙන හැම සාහිත්‍ය නිර්මාණයක්ම අපූර්වත්වයෙන් හා අර්ථාන්විත බවින් යුක්ත වේ." මෙම අදහස නිදසුන් සහිතව සාකච්ඡා කරන්න.

3. "විවිධ සාහිත්‍යකරුවෝ එකම වස්තු විෂය විවිධ සාහිත්‍යාංග ඔස්සේ නොයෙක් අර්ථ මතුවන සේ ප්‍රතිනිර්මාණය කරති." සනිදර්ශනාත්මකව විමසන්න.

4. "__දූල්වල අලංකාරේ__ නවකතාවෙහි දේශීය චිත්‍ර සම්ප්‍රදාය හා බැඳි පරම්පරාවක ආදරය විවාහය වැනි මිනිස් දහම් මෙන්ම අනාගතය පිළිබඳ සෞන්දර්යාත්මක ප්‍රකාශනයක්ද අන්තර්ගත වේ." විභාග කරන්න.

5. සමාජ අත්දැකීම් ප්‍රතිනිර්මාණයෙහිලා නූතන කෙටිකතාකරුවා ප්‍රකට කරන කුසලතාව ප්‍රභාත් ජයසිංහගේ "__හොකී විතවුට් ස්ටික්__" කෙටිකතාව ඇසුරින් විමසන්න.

6. පහත සඳහන් කවීන්ගෙන් __එක් අයෙක්__ තෝරා ගෙන ඔහුගේ/ ඇයගේ නිර්මාණ දායකත්වය අගයන්න.

   i. සිරි ගුනසිංහ
   ii. මහගම සේකර
   iii. මොනිකා රුවන්පතිරණ
   iv. ලක්ශාන්ත අතුකෝරල

7. ඔබ කැමති නවකතාවක් තෝරාගෙන ඒ පිළිබඳව විචාරාත්මකව අධ්‍යයනයක යෙදෙන්න.

********************